## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (පැයට ගෙවීමේ පදනම මත)

## <u>පැයට ගෙවීමේ පදනම මත</u>

**1. ඖෂධවේදී - III ශ්‍රේණිය**

**<u>සුදුසුකම්:</u>**

I. සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයයන් දෙකක් (02) එකවර සමත් වීම.

සහ

III. අ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ ඖෂධවේදී/ විද්‍යාවේදී (ඖෂධවේදී) උපාධියක් ලබා තිබීම.

හෝ

ආ. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන දෑ අවුරුදු පූර්ණ කාලීන ඖෂධවේදී ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

IV. අ. ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

හෝ

ආ. විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

III ශ්‍රේණිය - රු. 279.00 (පැයකට)

## 2. ඇමතුම් මධ්‍යස්ථාන නියෝජිත

**සුදුසුකම්:**

I. සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි ඇතුළු විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව වාර දෙකකට නොඅඩු වාර ගණනකින් විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්වීම අමතර සුදුසුකමක් වේ.

**අමතර සුදුසුකම්:**

I. වාචික සහ ලිඛිත, ඉංග්‍රීසි සහ සිංහල යන භාෂා ද්විත්වයෙන්ම විශිෂ්ඨ සන්නිවේදන කුසලතා තිබීම.
II. උසස් අයුරින් අයතනික සහ දුරකථන ආචාර විධි පිළිබඳව මනා අවබෝධයකින් යුක්ත වීම.
III. යහපත් අන්තර් පුද්ගල සබඳතා සහ කුසලතා සහිත අයෙකු වීම.
IV. පරිගණක සාක්ෂරතාවය ඉහල අගයක පැවතීම.
V. සියලුම මට්ටම්වල කාර්ය මණ්ඩල සමග සහයෝගයෙන් වැඩ කිරීමට ඇති හැකියාව.
VI. අවම වශයෙන් වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

පැයකට රු.250.00 ක් වශයෙන් ගෙවනු ලැබේ.

## පොදු කොන්දේසි

1. ඖෂධවේදි තනතුර වෙනුවෙන් එක් පැයක් සඳහා සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2025.04.28 දිනැති චක්‍රලේඛ අංක CA/SA/02/2025 අනුව ගෙවීම් සිදු කරනු ලැබේ.

2. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමඟින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතික වල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2025.10.01** දිනට හෝ ඊට පෙර "විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර" යන ලිපිනයට යොමු කල යුතු අතර, ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කල යුතුය.

3. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරිමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.

4. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී යොමුකරනු ලබන හෝ නියමිත ආකෘතියට අනුකූල නොවන හෝ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. මෙම කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාලයීය රෝහල් කාර්යමණ්ඩලය වෙත බඳවා ගනු ලබන අතර විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් නොවේ.

6. අයදුම්පත්‍ර භාගත කර ගැනීමට සහ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න.www.kdu.ac.lk / දුරකථන අංකය – 0112044555.

**www.kdu.ac.lk**